# සුභාෂිතයෙන්..

සිතමින් උඩඟු බව සතකුට නම කරති
සැපතින් සිටිම් සලකා නෙක දුක් විඳිති
පතමින් දිවි රැකුම රන මැද වැද නැසෙති
එබැවින් සෙබලුනේව් දද දන වෙනින් නැති

**ගැදි පැදිය :**

උඩඟු බව සිතමින්
(?) සතකුට නම කරති
සැපතින් සලකා
(?) නෙක දුක් විඳිති
දිවි රැකුම පතමින්
(?) රන මැද වැද නැසෙති
එබැවින්
සෙබලුනේව් දද දන /වෙනින් නැති

"උඩඟු බව සිතමින්" යන්න නිරවුල් කල යුතු තැනක් සේ පෙනේ. මා කියවා ඇති කිසි පොතක එය නිරවුල් කොට නැත. මට තේරෙන විදියට මම එය මෙසේ පහද දෙමි.



වි ක ධර්මබන්ධු

එක්තරා මිනිසෙක් (ගෑනියෙක්) තම කුලවත්කම, දනවත්කම, බලවත්කම, උගත්කම නිසා ඔලුව උදුම්මාගෙන තමා අනෙකුන්ට වැඩියෙන් උසස් යැයි සිතා ගෙන සිටී. කෙනකු දෙස නොබලා (ඉවත බලාගෙන) ඔහු ඇමතීම, මෙලෙක - මුදුව නොපෙන්නා කෙනකු දෙස රලුවට බැලීම, ගැඹුරු හඬින් ගැඹුරු වචන බාවිතා කරමින් කතා කිරීම, කෙනකු තමා වෙත එන බව දැක දැකත් නුදුටුවා සේ සිටීම, කෙනකු යමක් ඇසු විට නෑසුනා මෙන් සිටීම සමහර විට මඳක් පමා කොට උත්තර දීම ඔහුගේ සිරිතයි.

අසල් වැසියන් ඔහු ගේ වග තුග නොදත්තෝ ඔහු තමන්ට වඩා ඉහත් හෝ උසස් ලෙස සලකා ඔහුට ගරුසරු දක්වති. ඔහු පෙන්වන ලොකුව ඔහු ලග සැබවින්ම ඇද්දැයි සෙවීමට ඔහු වෑයම් නොකරති. රජ වු සිවලාගේ කතාව ඔබ දනිතැයි සිතමි. මේ කවියා මේ කියන්නේ එබඳු සතකු මිනිසකු ගැන සිතා ද?

නයා සිංහයා ඇතා වැනි සතුන්ටත් බුහුමන් දක්වන මිනිස්සු සිටිති. ඔවුන්ගේ බලවත් කම තෙදවත් කම අවතුරුවත් කම ගැන සලකා එසේ කරනවා විය හැකිය. මෙහි ඇති " සතකුට නම කරති" යන්න -සමහරු සතකුගේ උඩඟු බව සිතමින් ඔහුට (ඌට) නම තරති" යනුවෙන් ගැලපු විට ඉහත කී තේරුම් දෙකට ම එය ගැලපේ.

කෙසේ වෙතත් මුල් පද තුනටම උක්ත පද නොමැති වීම ලොකු අඩුවකි. ඔබේ කැමැත්ත අනුව එතැනට "සමහරු - මෝඩ මිනිස්සු" වැනි උක්ත පදයක් යොද ගත හැකිය.

"අද අද එය් මරු පින් කර ගන්නේ - කුමටද කා බී නිති සැරසෙන්නේ - කරන කලට පව් මිරිය මීසේ - "ආදි වශයෙන් ලෙව්යාම එපා කරවන අදහස් ගිල්ලා ඇති නිසා සමහරු මතු ලබන සැප ගැන සිතා අහසේ මාලිගා තනාගෙන දුක් විඳින සැටි ඔබ දැක ඇත. කොටින්ම අප අද ජීවත් වන ලෝකයේ සුබවත් යහපත් කිසිවක් නැත. ඒවා ඇත්තේ - ඒවා ලැබෙන්නේ පරලොවේ දීය.

වන්දනාවේ ගොස් (මක්කම - දඹදිව) පෙට්ටියක බහනු ලැබ ආපසු එන මිනිසුන් කටේ දිවේ උල් ගසා ගෙන සිටින මිනිසුන් එසේ කරන්නේ මතු -සැපතින් ඉඳිමි" සලකා ගෙනය.

අනෙක් සතුන්ට මෙන් ජීවිත සටනක් නැති වු විට මිනිසා ඒ සඳහා විකල්පයක් සොයා ගනී. කිසිම සතෙක් තම වර්ගයේ අන් සතකුට ආහාර සපයා නොදෙය්; රැකවරන නොසපයය්, වඳුරන්, ඇතුන්, වියගරුන් (වියාග්‍රයින්) අනුන්ට කෑම සපයා දුන් බව බව කතා පොත් වල සඳහන් වී ඇතත් සැබෑ ලොවේ එබඳු සිදුවීම් ගැන මා අසා නැත. (ටය්ග යන (ඉංගිරිසි වචනය) සතා කොටියා නොවේ. අප වලග පාශා ගෙන ටය්ගාවුන් කොටින් ලෙස හඳුන්වමු. කොටියාගේත් වියාග්‍රයාගේත් වෙනස ඔබ දනිති.

මේ කවියේ තුන් වැනි පදය ද අව්ලකි. දිවි රැක ගැනීම සඳහා යුද මැදට වැදීම (පැනීම) හොඳ සිහියෙන් සිටින කෙනකු නොකරන වැඩකි. සෙබලුන් යුදට යන්නේ පන රැක ගැනීම ගැන සිතා නොවේ. පන එපා යය් සිතා ගෙනය. යුද මැදට වදින්නේද දෙපිරිසක් අතර සටනක් පවතින විට ඒ මැදට පැනීමය.

"සෙබලුන් වැනි මෝඩ මිනිසුන් තවත් නැත" යනු බොලඳ කියමනකි. සෙබලුන් යුදට යන්නේ කෑම දිරවීමට නොවේ. වෙන කල යුතු වැඩක් නැති නිසාත් නොවේ. එය කල යුතුම කාරියක් නිසාය. එහෙය්න් සෙබලුන් තම මෝඩකම නිසා යුද වදිතැය් කීම කොතරම් බොලඳ කියමනක් ද?

මේ කවියේ දෙවන පදයේ ඇති සැඟවුනු අරුත මම අගය කරමි. තම ජීවිතය බේරා ගැනීම සඳහා තම ඇඟල්ලක්, අතක්, පයක්, (සමහර විට ලිඟුව) කප්පා ගත් මිනිසුන් ගැන මා අසා ඇත. ලිඟුවෙන් කරන කරන වැඩය කිරීමට වෙනත් ක්‍රමයක් නැතත් පිලිකාවක් හැඳුනු ලිඟුව කප්පා ගැනීම හැර වෙන කුමක් කරන්න ද ?

නම කෙරෙති - නමස්කාර / ගරු බුහුමන් කරති
නෙක - අනේක/ නොයෙක්, වෙනින් - වෙන / අන්‍ය වෙන වෙනත් වෙනින් යන පද තුනම සියබසේ වියහර වේ; සේ සෙයින් මෙනි.

කෙනෙකුගේ උඩඟුව ගැන සිතා - රැවටී ඔහුට නමස්කාර කරන මිනිසාගේත් සැප විඳිනු රිසියෙන් දුක් විඳින මිනිසාගේත් හිස අත ගා බැලිය යුතුය. සමහර විට අතට අසුවන තරමේ දෙපලක් තිබිය හැකිය.


**සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න**

03 8707 4604

0402 025 516

**email**
sannasanews@gmail.com



YSL

**Migration Services**

**We specialise in**

General Skilled Migration Visas
Applications for State Migration Plans
Onshore|Offshore Partner Visas
Sponsored Visitor|Tourist Visas
Student Visas
Parent Visas

**Yashodhara Sarachchandra Liyanaarachchi**
(Registered Migration Agent)
MARN: 0746956

**0430 359 006**

(Close to Latrobe university , RMIT and NMIT)
**6 Mat Rush Avenue, Bundoora, VIC 3083**
Tel: **03 9467 4468**
yasho@yslmigration.com

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0746956

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA